[ 1978 මාර්තු 03 වැනි දින අංක 307 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙන් උපුටා ගන්නා ලදී.]

එල්. ඩී.—බී 59/41.

## ධීවර ආඥාපනත

(212 වන අධිකාරය වූ) ධීවර ආඥාපනතේ 33 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය.

ෆෙස්ටස් පෙරේරා,
ධීවර අමාත්‍ය.

1978 ජනවාරි මස 20 වන දින,
කොළඹ දී ය.

### නියෝගය

1976 සැප්තැම්බර් මස 10 වන දින අංක 230 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1976 ධීවර බෝට්ටු (උකස්) නියෝගවල දෙවන උපලේඛනය වෙනුවට පහත සඳහන් අලුත් උපලේඛනය ආදේශ කිරීමෙන්, එම නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

| "දෙවන උපලේඛනය | ගෙවිය යුතු ගාස්තුව රු. | ශ. |
|---|---|---|
| උකස් කිරීමේ සාධක පත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා උකසක් බේරුම් කළ විට, උකස් ලේඛනයෙහි පිටසනක් කිරීම සඳහා ... | 12 | 50 |
| (අ) උකස බේරුම් කිරීමේ දැන්වීම ලැබුණු විට ... | 3 | 00 |
| (ආ) උකස බේරුම් කළ බවට සාක්ෂි වශයෙන් ඒ දැන්වීමේ අනුපිටපතක් භාරගත් විට ... | 3 | 00 |
| උකස් ලේඛනයේ ඇති සටහනක සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා ... | 3 | 50 |
| ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඇති පිටසනක සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා ... | 3 | 50 |
| බෝට්ටු ලේඛනයෙහි ඇති පිටසහනක සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා ... | 3 | 50 |
| බේරුම් කිරීමේ දැන්වීමක හෝ ඒ දැන්වීමේ අනුපිටපතක සහතික පිටපතක් නිකුත් කිරීම සඳහා ... | 3 | 50 |
| උකස් ලේඛනය සෝදිසි කිරීම සඳහා— | | |
| (අ) එක් මාසයක් හෝ ඊට අඩු කාලයක් හෝ සඳහා ... | 2 | 00 |
| (ආ) එක් මාසයකට වැඩි කාලයක එක් එක් මාසය සඳහා හෝ මාසයකින් කොටසක් සඳහා ... | 0 | 50 |
| (ඇ) අදාල සියලු විස්තර සපයා ඇති නිශ්චිත පිටසනක් සඳහා හෝ සටහනක් සඳහා ... | 2 | 00" |

3-37

ඊ 32311—150 (78/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

එල් ඩී—බී 59/41.

## ධීවර ආඥාපනත

(212වන අධිකාරය වූ) ධීවර ආඥාපනතේ 3:: වන වගන්තිය යටතේ ඇති බලතල ප්‍රකාර ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝග.

ධීවර අමාත්‍ය.

1976 අගෝස්තු මස 20 වන දින,
කොළඹ දී ය.

## නියෝග

1. මේ නියෝග 1976 ධීවර බෝට්ටු (උකස්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 'ධීවර බෝට්ටුව' යන්නට ධීවර ආඥාපනතෙහි එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය. 'අධ්‍යක්ෂ වරයා' යන්නෙන් ධීවර අධ්‍යක්ෂ වරයා අදහස් වන අතර එයට නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයෙක් හෝ අතිරේක නියෝජ්‍ය ධීවර අධ්‍යක්ෂවරයෙක් හෝ සහකාර ධීවර අධ්‍යක්ෂවරයෙක් හෝ මේ නියෝගවල කාර්යයන් සඳහා අධ්‍යක්ෂ විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරන ලද වෙනයම් නිලධර යෙක් හෝ ඇතුළත් වේ,

3. ධීවර බෝට්ටුවක් සම්බන්ධයෙන් උකසක් ලියා අත්සන් කරන (මෙහි මින් මතු 'උකස්කරු' යනුවෙන් සඳහන් කරනු ලබන) එම බෝට්ටුවේ අයිතිකරු මෙහි පළමුවන උපලේඛනයේ දක් වෙන 1 වන ආකෘතිය අනුව වූ උකස් කිරීමේ සාධන පත්‍රයකින් එසේ කළ යුතු ය.

4. ධීවර බෝට්ටු උකස් කිරීම් ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂ වරයා විසින් උකස් ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

5. (මෙහි මින් මතු 'උකස' යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර බෝට්ටුවක් පිළිබඳ උකසක් ලියා අත්සන් කරනු ලැබූ විට, ඒ බෝට්ටුව උකස් කරනු ලැබූයේ යම් තැනැත්තකුට ද (මෙහි මින් මතු 'උකස් හිමි' යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ තැනැත්තා විසින්, මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් උචිත ගාස්තුවක් සමග, උකස් කිරීමේ සාධන පත්‍රය, ලියාපදිංචි කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

6. උකසක් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවේහි දී ධීවර බෝට්ටුවේ ලියාපදිංචි කිරීමේ සහතිකය උකස්කරු විසින් උකස් හිමි වෙත භාරදිය යුතු ය; උකස් කිරීමේ සාධන පත්‍රය ලියාපදිංචි කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන විට උකස් හිමි විසින් ඒ සහතිකය අධ්‍යක්ෂ වරයා වෙත භාරදිය යුතුය.

7. උකස් කිරීමේ සාධන පත්‍රය සහ ඒ ධීවර බෝට්ටුවේ ලියාපදිංචි කිරීමේ සහතිකය ලැබුණු විට, අධ්‍යක්ෂවරයා විසින් උකස් කිරීමේ සාධන පත්‍රයට අනුක්‍රමික අංකයක් යෙදිය යුතු අතර, ඉන් පසු එම සාධන පත්‍රය අංක .........දරන සාධන පත්‍රය යනුවෙන් හඳුන්වනු ලැබිය හැකි ය.

8. උකස් කිරීමේ සාධන පත්‍රයට යොදනු ලැබූ අනුක්‍රමික අංකය ද උකස්කරුගේ නම හා ලිපිනය ද, ධීවර බෝට්ටුවේ ලියාපදිංචි අංකය ද, ඒ බෝට්ටුවේ ටොන් බර ප්‍රමාණය ද, උකස්හිමිගේ නම හා ලිපිනය ද, ඒ බෝට්ටුව ලියාපදිංචි කිරීමේ සහතිකයේ අංකය ද අධ්‍යක්ෂවරයා විසින් උකස් ලේඛනයෙහි ඇතුළත් කළ යුතු ය.

9. උකසක් ලියාපදිංචි කිරීමෙන් පසු, උකස ලියාපදිංචි කළ දිනය ද උකස් කිරීමේ සාධන පත්‍රයේ අනුක්‍රමික අංකය ද උකස්හිමිගේ නම හා ලිපිනය ද ධීවර බෝට්ටුව ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි සහ ධීවර බෝට්ටු ලේඛනයේ උචිත සටහන ඉදිරියේ අධ්‍යක්ෂ වරයා විසින් පිටසන් කොට, උකස් සාධන පත්‍රය උකස් හිමි වෙත ද ලියාපදිංචි කිරීමේ සහතිකය උකස්කරු වෙත ද ආපසු යැවිය යුතු ය.

10. උකසකට එම බෝට්ටුවම පිළිබඳ ව ඊට කලින් ලියා අත්සන් කරන ලද එහෙත් ඊට පසුව ලියාපදිංචි කරන ලද වෙන්ත් යම් උකසකට ඉහලින් ප්‍රමුඛත්වය ලැබිය යුතු ය.

11. උකසක් බේරනු ලැබූ විට, මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් උචිත ගාස්තුවක් සමග, මෙහි පළමුවන උපලේඛනයෙහි දක්වෙන 2 වන ආකෘතිය අනුව පිළියෙල කළ යුතු උකස බේරීමේ දැන්වීම අධ්‍යක්ෂ වෙත ද එම දැන්වීමේ අනු පිටපතක් උකස්කරු වෙත ද භාරදීම උකස්හිමි විසින් කළ යුතු ය.

12. උකස බේරීමේ දැන්වීම උකස් හිමි විසින් අධ්‍යක්ෂවරයා වෙත භාරදී නැත්තාවූත් එහෙත් උකස්කරු උකස බේරුම් කළ බව කියමින් ඒ දැන්වීමේ අනුපිටපත යයි හැඟවෙන ලියවිල්ලක් මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් උචිත ගාස්තුවක් සමග අධ්‍යක්ෂ වරයා වෙත භාරදෙන්නාවූත් අවස්ථාවක, මේ නියෝග යටතේ කිසි අන් කිසි ක්‍රියාවකට හෝ ප්‍රතිඵලවලට හානියක් නොමැතිව, උකස බේරුම් කළ බවට තමාට සෑහීමට පත්විය හැකි ආකාරයකින් තමා කැමති

අත් දමේ වෙනත් සාක්ෂි නොකැඳවා ම හෝ කැඳවීමෙන් පසු හෝ, උකස බේරුම් කළ බවට සාක්ෂි වශයෙන් ඒ අනුපිටපත අධ්‍යක්ෂ වරයා විසින් භාර ගත හැකි ය.

13. අවස්ථාවෝචිත පරිදි, උකසක් බේරුම් කිරීමේ දැන්වීම අධ්‍යක්ෂ වෙත ලැබුණු විට හෝ එම උකස බේරුම් කිරීමේ සාක්ෂි වශයෙන් ඒ දැන්වීමේ අනුපිටපතක් භාර ගනු ලැබූ විට, උකස බේරුම් කළ බව ද ඒ දැන්වීමෙහි හෝ ඒ අනුපිටපතෙහි හෝ සඳහන් වන උකස බේරුම් කළ දිනයද උකස් ලේඛනයෙහි උචිත සටහනට ඉදිරියෙන් අධ්‍යක්ෂවරයා විසින් පිටසන් කළ යුතු ය.

14. උකසක් බේරුම් කළ බව සහ එය බේරුම් කළ දිනය ද උකස් ලේඛනයෙහි පිටසන් කරනු ලැබූ විට, එම උකස බේරුම් කිරීමේ දැන්වීමෙහි හෝ ඒ දැන්වීමේ අනුපිටපතෙහි හෝ සඳහන් බේරුම් කිරීමේ දිනයෙහි උකස බේරුම් කරන ලදැයි සලකනු ලැබිය යුතු ය.

15. ඉහත කී පරිදි උකසක් බේරුම් කරනු ලැබූ විට, එසේ බේරුම් කරනු ලැබූ බවත්, එම උකස බේරුම් කිරීමේ දැන්වීමෙහි හෝ ඒ දැන්වීමේ අනුපිටපතෙහි හෝ සඳහන් පරිදි බේරුම් කළ දිනයත් ලියාපදිංචි කිරීමේ සහතිකය තමා වෙත ඉදිරිපත් කරනු ලැබුවහොත් එම සහතිකයෙහි ද ධීවර බෝට්ටු ලේඛනයෙහි උචිත සටහන ඉදිරි යෙහි ද අධ්‍යක්ෂවරයා විසින් පිටසන් කළ යුතු ය.

16. ධීවර බෝට්ටුවක් පිළිබඳ උකසක් වලංගුව පවතින කාලය තුළ ඒ බෝට්ටුව ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කරනු ලබන අවස්ථාවක, අලුත් කිරීමේ සහතිකයකට පෙරාතුවම අහෝසි වූ ලියා පදිංචි කිරීමේ සහතිකයෙහි පිටසන් කරන ලද්දාවූ එම උකසට අදාල විස්තර, ඒ අලුත් කිරීමේ සහතිකයෙහි පිටසන් කරනු ලැබිය යුතු අතර, ඒ අලුත් කිරීමේ සහතිකය ද ඒ උකසටම යටත් වන්නේ ය.

17. ධීවර බෝට්ටුවක් උකස්කරු විසින් වෙනත් තැනැත්තකුට පවරනු ලබන අවස්ථාවක හෝ එහි අයිතිය වෙනයම් ආකාරයකින් වෙනත් තැනැත්තකුට උරුම වන අවස්ථාවක, පැවරීමට පෙරාතුවම හෝ අයිතිය උරුමවීමට පෙරාතුවම හෝ බලපැවැත්වූ ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටසන් කරන ලද්දාවූ උකසට අදාළ වූ ද විස්තර, පැවරුම්ලාභී වෙත හෝ ඒ වෙනත් තැනැත්තා වෙත හෝ නිකුත් කරනු ලබන ඒ බෝට්ටුව ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටසන් කරනු ලැබිය යුතු ය. තවද ඒ පැවරීම හෝ ඒ අන් තැනැත්තා වෙත උරුම වූ අයිතිය ඒ වලංගුව පවත්නා උකසට යටත් විය යුතු අතර ඒ පැවරුම්ලාභී හෝ වෙනත් තැනැත්තා සියලු කාර්යයන් සඳහා උකස්කරු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

18. කවර තැනැත්තකු විසින් වුවද, මෙහි දෙවන උපලේඛනයෙහි සඳහන් උචිත ගාස්තුව ගෙවා, උකස් ලේඛනයෙහි යම් සටහනක හෝ ධීවර බෝට්ටුවක ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි පිටසනක හෝ මෙම නියෝග යටතේ ධීවර බෝට්ටු ලේඛනයෙහි කරන ලද පිටසනක හෝ උකසක් බේරුම් කිරීමේ දැන්වීමක හෝ ඒ දැන්වීමේ පිටපතක හෝ සහතික පිටපතක් අධ්‍යක්ෂවරයාගෙන් ලබාගත හැකිය.

19. 18 වන නියෝගය යටතේ ලබාගන්නා ලද ලේඛනයක සහතික පිටපතක් එහි සඳහන් කරුණු පිළිබඳ බැලු බැල්මට පිළිගත හැකි සාක්ෂිය වන්නේ ය.

20. කවර තැනැත්තකු විසින් වුව ද, මෙහි දෙවන උපලේඛන යෙහි සඳහන් උචිත ගාස්තුව ගෙවා, උකස් ලේඛනය සෝදිසි කිරීම සඳහා අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් කළ හැකි ය.

21. මේ නියෝග කිසිවක් කඩකරන උකස් හිමියකු හෝ උකස් කරුවකු වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකින් හෝ හයමසක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමෙන් හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකින් ම හෝ දඬුවම් කරනු ලැබීමට ඔහු යටත් වන්නේ ය.

## පළමුවන උපලේඛනය

### 1 වන ආකෘතිය

අංක ——— දරන උකස් කිරීමේ සාධන පත්‍රය

ලියාපදිංචි අංක ——— දරන ධීවර බෝට්ටුවේ ලියාපදිංචි අයිතිකරු වූ ——— හි පදිංචි ——— වන මම මුල් මුදල හා පොලිය වශයෙන් අයවිය යුතු සහ ම විසින් ගෙවිය යුතු සියලු මුදල් ගෙවීම සඳහා ඇප වශයෙන් ——— හි පදිංචි ——— ට මෙම සාධන පත්‍රයේ උපලේඛනයෙහි විස්තර කර ඇත්තාවූ සහ මෙහි උපලේඛනයෙහි සඳහන් කර ඇත්තාවූ එකී බෝට්ටුව මෙයින් උකස් කරමි.

ඊට සාක්ෂි වශයෙන් ——— වන මම එකම වේලාවේදී සහ ස්ථානයේදී සිය අත්සන් මෙයට තබා ඇති ——— හි පදිංචි ——— සහ ——— හි පදිංචි ——— ඉදිරිපිටදී මෙම උකස් කිරීමේ සාධන පත්‍රයට මෙයින් මාගේ අත්සන/මාපටැඟිලි සලකුණ යොදමි.

———,
උකස්කරුගේ අත්සන.

197 ——— මස ——— වන දින ——— දී ය.

සාක්ෂිකරුවෝ :
1.
2.

ඉහත සඳහන් කරන ලද උපලේඛනය

ධීවර බෝට්ටුවේ වටිනාකම :———.
ධීවර බෝට්ටුත් සමග උකස් කළේ නම් :—
ධීවර ආම්පන්නවල වටිනාකම :———.
ඇන්ජිමේ වටිනාකම :———.
උපකරණවල වටිනාකම :———.
යන්ත්‍රෝපකරණවල වටිනාකම :———.
ධීවර බෝට්ටුවේ ටොන් බර :———.
බෝට්ටුව/ආම්පන්න ආදිය උකස් කරන ලද්දේ යම් මුදලකට ද ඒ මුදල රු :———.
එකඟ වී නම් ආපසු ගෙවන දිනය :—
වාර්ෂික පොලී ප්‍රමාණය :———.

———,
උකස්කරුගේ අත්සන

සාක්ෂිකරුවෝ :
1. ———.
2. ———.

### 2 වන ආකෘතිය

#### උකස බේරීමේ දැන්වීම

ධීවර අධ්‍යක්ෂවරයා වෙත ය.

අංක ——— දරන උකස් කිරීමේ සාධන පත්‍රය යටතේ උකස්ගිම් වන ——— හි පදිංචි ——— වන මම ඉහත සඳහන් සාධන පත්‍රය යටතේ උකස්කරු වන ——— පදිංචි ——— අද දින එකී උකස බේරුම් කළ බව ධීවර බෝට්ටු (උකස්) නියෝග වල ——— නියෝගය ප්‍රකාර ඔබ වෙත මෙයින් දැනුම් දෙමි.

මේ දැන්වීමේ අනු පිටපත මා විසින් උකස්කරු වෙත භාරදී ඇත.

———,
උකස්ගිම්ගේ අත්සන.

197 ——— මස ——— වන දින,
——— දී ය.

## දෙවන උපලේඛනය

උකස් කිරීමේ සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා, අයකර ගත හැකි මුදල— 6:12.50

(අ) රුපියල් පන්සියය නොඉක්මවන විට රුපියල් 6.50 යි.
(ආ) රුපියල් පන්සියය ඉක්මවන විට රුපියල් 10 සහ රුපියල් පන්සියයක හැම අතිරේක ඒකකයක් සඳහා රුපියල් 4 ක අමතර ගාස්තුවක් ද වේ.

උකසක් බේරුම් කළ විට, උකස් ලේඛනයෙහි පිවිසුමක් කිරීම සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) උකස බේරුම් කිරීමේ දැන්වීම ලැබුණු විට ... | 3 | 0 |
| (ආ) උකස බේරුම් කළ බවට සාක්ෂි වශයෙන් ඒ දැන්වීමේ අනුපිටපතක් භාරගත් විට ... | 3 | 0 |
| උකස් ලේඛනයේ ඇති සටහනක සහතික පිටපතක් සඳහා ... | 3 | 50 |
| ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඇති පිටපතක සහතික පිටපතක් සඳහා ... | 3 | 50 |
| බෝට්ටු ලේඛනයෙහි ඇති පිවිසුමක සහතික පිටපතක් සඳහා ... | 3 | 50 |
| බේරුම් කිරීමේ දැන්වීමක හෝ ඒ දැන්වීමේ අනුපිටපතෙහි සහතික පිටපතක් සඳහා ... | 3 | 50 |
| උකස් ලේඛනය සෝදිසි කිරීම සඳහා— | | |
| (අ) නිශ්චිතව සඳහන් කරන එක් මාසයක් හෝ ඊට අඩු කාලයක් හෝ සඳහා ... | 2 | 0 |
| (ආ) නිශ්චිතව සඳහන් කරන එක් මාසයකට වැඩි කාලයක, එක් එක් මාසය සඳහා හෝ මාසයකින් කොටසක් සඳහා ... | | 50 |
| (ඇ) අදාළ සියලු විස්තර සපයා ඇති නිශ්චිත පිවිසුමක් සඳහා හෝ සටහනක් සඳහා ... | 2 | 0 |

9-191—76.09.10 දින අංක 2[illegible]0 දරණ ගැසට් පත්‍රය